# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2022
2024 ඔක්තෝබර් / නොවැම්බර්

**සමාජීය විද්‍යා පීඨය**

## පුරාවිද්‍යාව
(නව නිර්දේශය)

**පුරාවිද්‍යාවේ නිර්වචන, ක්‍රම සහ විධි - ARCH 18224**

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි. කාලය : පැය 03 යි.

---

01. පුරාවිද්‍යා විෂයයේ අරමුණු, මූලාශ්‍ර හා කාර්යයන් පැහැදිලි කරන්න.

02. පුරාවිද්‍යා විෂය පුළුල්ව හැදෑරීමට බහු විෂයයීය අධ්‍යයනයේ වැදගත්කම ක්ෂේත්‍ර කිහිපයක් ඇසුරින් විස්තර කරන්න.

03. මානව සමාජයේ සංකීර්ණතාව හඳුනාගැනීම සඳහා පුරාවිද්‍යා කැණීමක් විධිමත්ව සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා අර්ථ නිරූපණය සිදුකරන ආකාරය සාකච්ඡා කරන්න.

04. කාලානුක්‍රමික අනුපිළිවෙළ, සංස්කෘතික වර්ධනය හා සැසඳීමේ අධ්‍යයනය වැනි කාර්යයන් සඳහා සාපේක්ෂ කාලනිර්ණයේ ඇති වැදගත්කම විස්තර කරන්න.

05. "පුරාතනය විධිමත් ලෙස වාර්තාගත කිරීම හා තේරුම්ගැනීමට පුරාවිද්‍යා ගවේෂණ අත්‍යවශ්‍ය වේ." මෙම ප්‍රකාශයේ ඇති සත්‍යාසත්‍යතාව පරීක්ෂා කරන්න.

06. පුරාවිද්‍යාඥයෙකු විසින් පුරාවිද්‍යා දත්ත විධිමත්ව සංවිධානය කිරීම හා විශ්ලේෂණය කිරීම සඳහා වර්ගීකරණ ක්‍රම යොදාගන්නා ආකාරය පැහැදිලි කරන්න.

07. පුරාවිද්‍යා සොයාගැනීම් මගින් මතුකරගන්නා දැනුම බෙදාහරින විධික්‍රම කිහිපයක් සාකච්ඡා කරන්න.

08. පුරාවිද්‍යා කෞතුකාගාර හා විධි ක්‍රම අතර ඇති සම්බන්ධය පැහැදිලි කරන්න.

*********************************